www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නාසිවාදයට එරෙහිව රතු හමුදා ලැබූ ජයග්‍රහනයේ 60 වන සංවත්සරය පිලිබඳව බෝල්ටික් රාජ්‍යයන්වල රුසියානු විරෝධී ජාතිකවාදය

## On the 60th anniversary of the victory of the Red Army over Nazism Anti- Russian nationalism in the Baltic States

**නියැල් ග්‍රීන් විසිනි**

**2005 මැයි 9**

*මෙහි පල වන්නේ ලිපි දෙකකින් සමන්විත ලිපි මාලාවක පලමුවැන්නයි.*

නැගෙනහිර යුරෝපය තුල පැරනි සෝවියට් ආධිපත්‍යය ''ඉතිහාසයේ මහා වරදවලින්'' එකක් ලෙස හෙලා දකිමින් මැයි 7 දා ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් කල කතාව සඳහා ඔහු තෝරාගත්තේ ලැට්වියාවේ රිගා අගනුවර ය.

50 වසරකට ආසන්න සෝවියට් ග්‍රහනයේ කාල සීමාව තුල ''වේදනාවේ හා බලාපොරොත්තුවේ දිගු පරික්ෂනයක'' යෙදී සිටීම පිලිබඳව බුෂ් ලැට්වියාව, එස්තෝනියාව හා ලිතුවේනියාව යන බෝල්ටික් රාජ්‍යයන් වර්නනා කලේ යුරෝපයේ දෙවන ලෝක යුද්ධය අවසාන වී 60 වන වසර සමරමිනි. දෙවන ලෝක යුද්ධාවසානය මෙම රටවලට සාමය ගෙනඑනු ලැබුව ද එය ''කොමියුනිස්ට් ග්‍රහනය හා මර්දනය'' ද ගෙන ආ බව බුෂ් ප්‍රකාශ කර සිටියේ ය.

රුසියාව හා බෝල්ටික් රාජ්‍යයන් තුනේ දේශපාලන තන්ත්‍රයන් අතර තියුනු වී ඇති ආතතීන් ගසාකෑමට මොස්කෝව මත තම ප්‍රහාරය එල්ල කිරීම සඳහා ස්ථානය ලෙස බුෂ් ලැට්වියාව තෝරා ගත්තේ ය. නාසි ජර්මනියට එරෙහිව සෝවියට් සංගමය හා මිත්‍ර හමුදාවන් ලැබූ ජයග්‍රහනයේ 60 වන සංවත්සරය සැමරීමට මැයි 9 දා මොස්කව් හි පැවැත්වෙන උත්සවයට සහභාගි වන ලෙස රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් සියලු පැරනි සෝවියට් රටවල නායකයන්ට ආරාධනා කිරීමෙන් පසුව බෝල්ටික් රටවල දේශපාලනඥයන් හා මාධ්‍ය කොමියුනිස්ට් විරෝධී හා රුසියානු විරෝධී උමතුවකින් වෙලී ගොස් තිබේ.

රුසියානු/සෝවියට් ''අධිරාජ්‍යවාදය'' හා ''යටත් කිරීම'' ලෙස තමන් වර්ග කල සැමරුමට සහභාගි නොවන ලෙස බෝල්ටික් රටවල දේශීය පුවත්පත් හා විචාරකයන් තම රාජ්‍ය නායකයන් පොලඹවාලුහ. නාසි ජර්මනියේ සදාචාරමය හා දේශපාලනික සාම්‍යය ලෙස සෝවියට් සංගමය පින්තාරු කිරීමට තිබූ අවස්ථා කිහිපයක් ගිලිහී ගියේ ය.

මැයි 9 දා මොස්කව් සැමරුමට සහභාගි නො වන බව ප්‍රථමයෙන් ප්‍රකාශ කලේ එස්තෝනියානු ජනාධිපති ආනෝල්ඩ් රූට්ල් ය. සත්‍යය සඟවමින් ටික කලක් ගතකල ලිතුවේනියානු ජනාධිපති වැල්ඩාස් ඇඩම්කස් තමන් ද සහභාගි නො වන බව නිවේදනය කලේ ය. උත්සවයට සහභාගි වූ එකම තැනැත්තිය වූයේ ලැට්වියානු රාජ්‍ය නායිකා වැයිරා වයික් ෆ්රෙයිබර්ගා පමනි.

ආරාධනාව කෙරෙහි ලැට්වියාව මඳක් ලිහිල් ප්‍රතිචාරයක් දැක් වූයේ තමන්ට මොස්කෝව සමග පවතින ඉතා වැදගත් ආර්ථික සබඳතාවලට හානි වේ යයි සැලකීම නිසා ය. තම වෙලඳ හා බලශක්ති අවශ්‍යතාවල වැඩි පංගුවක් සඳහා බෝල්ටික් රාජ්‍යයන් තුන ම ආර්ථික වසයෙන් රුසියාව මත රඳා සිටින නමුත් රුසියානු ආර්ථිකය සමග දැඩි ඒකාබද්ධතාවක් ඇත්තේ ලැට්වියාවට යි.

මොස්කෝවට දක්වන සහනය මධ්‍යයේ වුව පශ්චාත් යුද්ධ සෝවියට් කාල පරිච්ඡේදය ''සාහසික යටත් කිරීමක්'' යයි සඳහන් කිරීමට තමා මෙම අවස්ථාව උපයෝගී කර ගන්නා බවට වයික් ෆ්රෙයිබර්ගා පැහැදිලි කලා ය. වයික් ෆ්රෙයිබර්ගාගේ සහභාගි වීම සෝවියට් කාල පරිච්ඡේදය නාසින්ගේ යටත් කර ගැනීමට සමාන වූවක් බව තවදුරටත් ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාවක් සම්පාදනය කල හැකි බැවින්, ''දැන් ලැට්වියාව කරන දෙය බෝල්ටික් රාජ්‍යයන් තුන සඳහා ම යහපත් යයි'' ප්‍රකාශ කල එස්තෝනියානු විදේශ අමාත්‍ය රෙයින් ලැන්ග් ඇයගේ තීරනයට සහාය දක් විය.

බෝල්ටික් රාජ්‍යයන්වල සෝවියට් කාල පරිච්ඡේදය පිලිබඳ නිල දේශපාලන මතයේ පොදු තානය මෙය යි. මොස්කව්හි පැවැත්වෙන 60 වන සංවත්සර සැමරුම සඳහා සහභාගි වන්නේ ද නැද්ද යන්න පිලිබඳ විවාදය ධනේශ්වර දේශපාලනයේ පදනම සකසනු ලබන ජාතිකවාදී හා කොමියුනිස්ට් විරෝධී දෘෂ්ටිවාදයේ නවතම ප්‍රකාශනය පමනි.

සෝවියට් සංගමයේ බිඳ වැටීමට බොහෝ කලකට පෙර ස්ටැලින්වාදී නිලධරයේ ආශීර්වාදය යටතේ ආරම්භ වූ පැරනි සෝවියට් සංගමයේ කම්කරු පන්තිය සමග බෝල්ටික් ප්‍රදේශයේ කම්කරු පන්තියට ඇති පොදු උරුමයෙන් ඔවුන්ව වෙන් කිරීමේ ක්‍රියාවලියක බෝල්ටික් රටවල ප්‍රභූ තන්ත්‍ර, ඔවුන්ගේ මාධ්‍ය හා බුද්ධිජීවී ක්ෂමාලාපකයන් පශ්චාත් සෝවියට් කාල පරිච්ඡේදය පුරාම සාමූහිකව යෙදී සිටියහ.

ඇත්ත වශයෙන්ම, බෝල්ටික් කම්කරු පන්තියට, ඔවුන්ගේ රුසියානු සහෝදරයන් සහෝදරියන් සමග ඇති පොදු හා පොහොසත් විප්ලවාකාරී ඉතිහාසය ස්ටැලින්වාදී නිලධරයේ අපරාධවලින් මකා දැමිය නොහැක.

1917 දී ලැට්වියානු අගනුවර වන රිගා හා ජර්මනු ආධිපත්‍යය යටතේ නො පැවති අනෙකුත් ප්‍රදේශවල කම්කරු නියෝජිත සෝවියට් සභා ස්ථාපනය කරනු ලැබූයේ එම ප්‍රදේශය පලමු ලෝක යුද්ධයේ සටන් බිමක් ව තිබියදීම ය. ඊට පසුව පැමිනි මාස කිහිපයේ දී රිගා කම්කරු පන්තිය අතර බොල්ෂෙවික්වාදය ප්‍රමුඛ දේශපාලනය බලය බවට පත් විය.

පෙට්රොග්‍රෑඩ්හි තාවකාලික ආන්ඩුව බලයට පත් වීමෙන් පසුව පිහිටුවනු ලැබූ මාපායෙව් නම් ධනේශ්වර ප්‍රාදේශිය සභාව මත කම්කරුවන්ගේ, නාවිකයන්ගේ හා සොල්දාදුවන්ගේ සෝවියට් සභා නිර්ධනයින්ට හා ගොවිජනතාවට ආකර්ෂනීය ධ්‍රැවයක් බවට පත් වෙමින් 1917 දී එස්තෝනියාවේ ද බොල්ෂෙවික්වරු පෙරමුන ගත්හ.

1917 ඔක්තෝබරය වන විට එස්තෝනියානු හා ලැට්වියානු සෝවියට් සභාවල ප්‍රධාන ප්‍රවනතාව බවට බොල්ෂෙවිකයන් තමන්ව ස්ථාපනය කර ගෙන තිබුනි. මෙම කලාපයෙන් පෙට්රොග්‍රෑඩ් වෙත යවනු ලැබූ නියෝජිතයන් දිග හැරෙමින් පැවති විප්ලවකාරී ක්‍රියාවලිය තුල වැදගත් භූමිකාවක් ඉටු කලහ. විප්ලවයෙන් පසුව ප්‍රතිවිප්ලවවාදී ධවල හමුදා සංවිධානය කල අධිරාජ්‍යවාදීන්ගේ ද දේශීය වංශවතුන්ගේ ද ධනපති පන්තියේ ද ප්‍රහාරවලින් විප්ලවය ආරක්ෂා කර ගැනීම සඳහා ලියොන් ට්‍රොට්ස්කි විසින් ගොඩනගනු ලැබ නායකත්වය දුන් රතු හමුදාව තුල බෝල්ටික් රටවල කම්කරුවෝ ද සටන් කලහ. ලැට්වියානු සන්නද්ධ භටයෝ ලෙනින්ගේ පුද්ගලික ආරක්ෂකයන් ලෙස පවා කටයුතු කලහ.

1918 නොවැම්බර් මාසයේ දී ජර්මනිය ලැබූ පරාජය පසුව ජර්මානු හමුදා විසින් අත් හැර දමනු ලැබූ බෝල්ටික් ප්‍රදේශවලට රතු හමුදාව හා පිටුවහලේ සිටි සමාජවාදීන් ඇතුල් වුයේ එහි සෝවියට් පාලනය ද ස්ථාපනය කරමිනි. පසුව පැමිනි සිවිල් යුද්ධයේ කාල පරිච්ඡේදය තුල දී ස්වදේශීය ප්‍රතිවිප්ලවවාදී ජාතිකවාදී බලවේගයන්ට හා ඔවුන්ගේ විදේශීය අධිරාජ්‍යවාදී ආධාරකරුවන්ට එරෙහිව මෙම කලාපයෙන් රතු හමුදා වෙත පුලුල් සහයෝගයක් ලැබුනි. ප්‍රධාන නාගරික මධ්‍යස්ථානවලින් මෙන්ම මධ්‍යකාලීන යුගයේ සිට ඉඩම්වල අයිතිය දරා සිටි ජර්මානු හා පෝලන්ත වංශවතුන්ගෙන් තමන්ව නිදහස් කර ගත හැකි බලයක් ලෙස බොල්ෂෙවිකයන් දැක ගත් ග්‍රාමීය ගොවි ප්‍රදේශවලින් ද මෙම සහාය ලබාගත හැකි විය.

කෙසේ වුවද පමනට වඩා බෙහෙවින් විහිදී සිටි රතු හමුදාවට බෝල්ටික් කලාපය තුල තම බලය පවත්වාගෙන යාම අසීරු වූ අතර 1920 දී ලිතුවේනියාවේ, ලැට්වියාවේ හා එස්තෝනියාවේ නව ධනපති රාජ්‍යයන් සමග ගිවිසුම් අත්සන් කිරීමට මොස්කව්හි බොල්ෂෙවික් ආන්ඩුවට බල කෙරුනි. දස දහස් ගනන් විප්ලවීය කම්කරුවන්ට කලාපය අතහැර සෝවියට් සංගමය වෙත පලායාමට කරුනු යෙදුනු ප්‍රාදේශීය කම්කරු පන්තියේ පරාජයේ නිෂ්පාදිතයක් ලෙස මෙම රටවල් ස්ථාපනය කරනු ලැබුනි.

පැරනි සෝවියට් සංගමයේ කම්කරු පන්තිය විසින් දියත් කරනු ලැබූ පොදු අරගල වෙනුවට අද දින බෝල්ටික් ප්‍රභූ තන්ත්‍රයන් විසින් වර්නනා කරනු ලබන්නේ අන්තර් යුද්ධ කාල පරිච්ඡේදයේ පිහිටුවනු ලැබූ ප්‍රතිවිප්ලවවාදී ධනේශ්වර ආන්ඩු ය. ඔවුන්ගේ වර්තමාන අනුප්‍රාප්තිකයන් මෙන්ම

1920 දී නිර්මානය කරනු ලැබූ රාජ්‍යයන් තුන ද ගැබ් කර ගත්තේ අසල් වැසි විශාල රාජ්‍යයන් වෙත ආර්ථික යටහත් භාවයද ජාතිකවාදී ස්වෝත්තමවාදී දේශපාලන ධර්මතාවය වූ පරිසරයක් නඩත්තු කිරීම ය.

ස්වාධීනත්වයේ අන්තර් යුද්ධ කාල පරිච්ඡේදය තුල තම පාලනයේ මුක්කු ලෙස දක්ෂිනාංශක හා ෆැසිස්ට් කොටස් මත රැඳී සිටීමට බෝල්ටික් තන්ත්‍රයන්ට සිදු විය. විරුද්ධ පාක්ෂික සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් වාර්තාගත සංඛ්‍යාවක් කම්කරු පන්තිය විසින් තෝරා පත් කරගත් පාර්ලිමේන්තු මැතිවරනවලින් පසුව ලිතුවේනියාවේ දක්ෂිනාංශික සභාග ආන්ඩුව අභ්‍යන්තර අර්බුදයකින් ඇලලීගත් 1926 දී මෙම රටවල් තුනෙන් ආර්ථික වසයෙන් දුබලම හා වඩාත් පසුගාමී රට වන ලිතුවේනියාව තුල ආඥාදායක පාලනයක් අටවනු ලැබිනි. තම බේදීම් විසඳා ගැනීමට අපොහොසත් වූ ද කම්කරු පන්තියට මාරාන්තික ලෙස බිය වූ ද පාලක තන්ත්‍රය, මොස්කව් ඒජන්තයින් විසින් සිදු කරන කුමන්ත්‍රනයක් පිලිබඳ භීතිය අවුස්සාලීම ඉලක්ක කර ගත් ප්‍රචාරක ව්‍යාපාරයක් මධ්‍යයේ බලය පැහැර ගත් ෆැසිස්ට්වාදී ජාතිකවාදී සංගමයේ ප්‍රධානියා වූ ඇන්ටොනාස් ස්මෙටෝනා වෙත හැරුනි.

රතු හමුදාවට එරෙහිව සටන් වැද පසුව රාජ්‍යයේ ප්‍රති-කොමියුනිස්ට්වාදී ආරක්ෂක පවුර ලෙස පෝෂනය කරනු ලැබුවා වූ ද සුලු ධනේශ්වරය පදනම් කොට ගත් නාසි වර්ගයේ සංවිධානයක් වූ ස්වාධීන යුද්ධ නිපුනයන්ගේ ලීගය 1928 දී එස්තෝනියාවේ පිහිටුවනු ලැබුනි. රටෙහි පැවති කුනුවූ ජාතිකවාදී වාතාවරනය තුල 1920 ගනන් අගභාගයේ හා 1930 ගනන් මුල ඇති වූ ආර්ථික හා සමාජ අර්බුදයේ කාලසීමාව තුල තමන්

වෙත සහයෝගිතා පදනමක් සකසා ගැනීමට මෙම සංවිධානය සමත් විය. මෙම පක්ෂය ජාතික ප්‍රභූ තන්ත්‍රය සමග දැඩි සබඳතා ගොඩනගාගෙන තිබුන ද බලයට පත් වීමට තරම් ස්ථාවර බවක් නො පෙන් වූ බවට පිලිගෙන තිබුනි. එහෙත් එම සංවිධානයේ නැගී ඒම මාෂල් නීතිය ක්‍රියාත්මක කිරීමට ද සිවිල් යුද්ධයේ ප්‍රමුඛ ජාතිකවාදීන්ගෙන් එක් අයකු වූ කොන්ස්ටැන්ටින් පැට්ස්ගේ 1934 ආඥාදායක පාලනය යුක්ති සහගත කිරීමට ද එස්තෝනියානු ධනේශ්වරයට අවස්ථාව සැලස්වී ය.

එස්තෝනියාවේ සිද්ධීන්ට ප්‍රතිචාර ලෙස කම්කරු පන්තියේ වාමාංශික ව්‍යාපාරයක් වැඩී ඒමේ හැකියාවෙන් ද දිග් ගැසුනු ආර්ථික අවපාතයෙන් ද භීතියට පත්ව සිටි ලැට්වියානු පාලන තන්ත්‍රය ලැට්වියාව ද වහාම එස්තෝනියානු මාවතට හැරවී ය. 1934 මැයි මාසයේ දී අර්ධ ආඥාදායක බලතල සමග ''ජාතික සමගි කැබිනෙට්ටුව'' ස්ථාපනය කරන ලදී.

## ස්ටැලින්වාදයේ භූමිකාව

වත්මන් බෝල්ටික් රාජ්‍යයන්හි ධනේශ්වරයේ බොහෝ සාමාජිකයන් ස්ටැලින්වාදී නිලධරය තුලින් පැමිනියවුන් වීමේ තතු තුල ජාතිකවාදය හරහා තම පාලනයට මුක්කුව දීම සඳහා ස්ටැලින්වාදීන් දශක ගනනාවක් පුරා කරනු ලැබූ පාවාදීමේ උරුමය ගසා කෑමට ප්‍රභූ තන්ත්‍රයන් සමත් වී ඇත.

1928 දී වාම විපාර්ශ්වයේ සාමාජිකයන් දහස් ගනනින් අත් අඩංගුවට ගැනීමෙන් පසුව 1920 ගනන් අවසානය වනවිට ස්ටැලින් ද ඔහු වටා සිටි කල්ලිය ද නිලධාරිවාදී පාලනයක් තහවුරු කර ගැනීමට සමත්වීම සෝවියට් කම්කරු පන්තියට ද ලෝක විප්ලවයට ද ප්‍රධාන පසුබෑමක් විය. 1929 පටන් සාහසික කෘෂිකාර්මික සාමූහිකකරනය වැනි විනාශකාරී ප්‍රතිඵල ජනනය කල ජාතිකවාදී ''තනිරටේ සමාජවාදය'' පිලිබඳ ප්‍රතිපත්තිය මත පිහිටමින් ස්ටැලින්වාදය කම්කරුවන් හා ගොවීන් දස ලක්ෂ ගනනක් සෝවියට් සංගමයෙන් පරත්වාරෝපිත කලේ ය.

තනිරටේ සමාජවාදය පිලිබඳ ඉදිරිදර්ශනය පිලිගැනීම කොමියුනිස්ට් පක්ෂවල මූලෝපායික අක්ෂය එනම් ලෝක සමාජවාදී විප්ලවය සඳහා අරගලය ප්‍රතික්ෂේප කිරීමක් සලකුනු කලේ ය. ඒ වෙනුවට එය සෝවියට් සංගමයේ පැවැත්ම ආරක්ෂා කිරීම මූලික කොට ගත් ජාතිකවාදී ඉදිරි දර්ශනයක් ආදේශ කල අතර එහිම විස්තාරනය ලෙස සෝවියට් සංගමයේ පසුගාමිත්වයේ හා හුදකලාබවේ ප්‍රතිඵලයක් ලෙස පැන නැගුනු ස්ටැලින් වටා සිටි නිලධාරිවාදී කුලයේ වරප්‍රසාදිත පැවැත්මෙහි පදනම ආරක්ෂා කලේ ය.

යුරෝපීය හා ජාත්‍යන්තර කම්කරු පන්තිය තුල විප්ලවවාදී මනෝගතිය පැතිරයාම ද එය සෝවියට් සංගමය මතට ඇති කරන්නා වූ උත්තේජක බලපෑම ද තම පැවැත්මට ඇති විශාලම තර්ජනය ලෙස සැලකූ ස්ටැලින්වාදී නිලධරය මුලදී එම කම්කරු පන්තියේ විප්ලවවාදී අරගල පිලිබඳ සැකසංකාවෙන් යුක්ත වූ අතර පසුව ඒවාට ක්‍රියාකාරී ලෙස සතුරු විය. ස්ටැලින්වාදීන් විසින් අනුගමනය කරනු ලැබූ විනාශකාරී ප්‍රතිපත්තීන්ගේ ප්‍රතිඵලයක් ලෙස ද එක් වෙඩිල්ලක් හෝ පත්තු නොකර ම හිට්ලර් බලයට පැමිනීම ද විසින් 1933 දී ජර්මානු කම්කරු පන්තියේ පරාජය සලකුනු කරනු ලැබුනි. කම්කරු පන්තියේ ඕනෑම හා සෑම ස්වාධීන දේශපාලන ක්‍රියාවලියක් ම වර්ධනය කිරීමට ක්‍රියාකාරී ලෙස වැඩ කරන සවිඥානික ප්‍රතිවිප්ලවවාදී බලයක් බවට සෝවියට් සංගමයේ නිලධරය ඉස්මතු විය. ජාතිකව පිලිසිඳගන්නාවූ නිලධරයේ අවශ්‍යතා ආරක්ෂා කිරීමේ උපකරන බවට නිලධරය කොමියුනිස්ට් පක්ෂයන් පරිවර්තනය කලේ ය.

සෝවියට් සංගමය ආරක්ෂා කර ගැනීම විප්ලවවාදී මාධ්‍යයන්ගෙන් තහවුරු කරනවා වෙනුවට විවිධ ධනේශ්වර බලවතුන් හා ධනේශ්වර රාජ්‍යයන් තුල ප්‍රගතිශීලී යයි සැලකූ කොටස් සමග එකඟතාවන් ඇති කර ගැනීම් මගින් ක්‍රියාවට නැගීමට මං සෙවී ය. ස්ටැලින්වාදීහු සාහසික ලෙස තම සමාජවාදී හා වාමාංශික ප්‍රතිවාදීන් මර්දනය කරමින් ෆ්‍රැන්කෝට එරෙහි අරගලයේ දී කම්කරු පන්තිය ප්‍රජාතාන්ත්‍රික ධනේශ්වරයට යටත් විය යුතු බව අවධාරනය කල ස්පාඤ්ඤ විප්ලවයේ පරාජය හා පවාදීම විසින් මෙම ප්‍රතිපත්තියේ ඇති ව්‍යසනකාරී බව විදහා දක්වයි. දෙවන ලෝක යුද්ධයේ මුවවිටදී යුරෝපය පුරා කම්කරු පන්තිය නිරායුධ කිරීමට හා අවමංගත කිරීමට තුඩු දුන් ස්ටැලින් කල්ලිය නාසි ජර්මනිය සමග ගිවිසුමකට එලඹීමට දැරූ උත්සාහය තුල එම ප්‍රතිපත්තියේ වඩාත්ම විනාශකාරී ප්‍රතිඵල ගැබ්ව තිබුනි.

1939 දී මොලටොව් හා රිබන්ත්‍රොප් අතර ඇති කර ගත් ගිවිසුමෙන් ජර්මනිය හා සෝවියට් සංගමය අතර ආක්‍රමනයන් වැලැක්වීමටත් මෙම රටවල් දෙක අතර ඊසාන දිග යුරෝපය යලි බෙදා ගැනීමටත් පොරොන්දු විය.

බෝල්ටික් රටවල් වෙතට හමුදා යැවූ සෝවියට් සංගමය 1940 දී එම රටවල් තුන ඈඳා ගත්තේ ය. ජාතිකවාදීන් හා ස්ටැලින්වාදයේ විරුද්ධවාදීන් නෙරපීම ආරම්භ කරනු ලැබිනි. දක්ෂිනාංශක ජාතිකවාදී බලවේගයන් වෙත විශ්වාසය ලබා දුන් ස්ටැලින්ගේ සාහසික හා දඩබ්බර ක්‍රියා පිලිවෙත කම්කරු පන්තිය දේශපාලනිකව අවමංගත කලේ ය. මෙහි ප්‍රතිඵලය වූයේ ස්ටැලින්වාදී නිලධරයේ සාමකාමී වීමට ගත් උත්සාහයන්වලට හිලව්ව ලෙස ජර්මන් හමුදාව 1934 දී බෝල්ටික් රාජ්‍යයන් ආක්‍රමනය කරමින් ද සෝවියට් සංගමයට එරෙහිව යුද්ධයක් දියත් කරමින් ද මැදිහත් වූ විට එයට එරෙහි විරුද්ධත්වය දුර්වල කිරීම යි.

ජර්මනිය බෝල්ටික් රාජ්‍යයන් ග්‍රහනයට ගෙන සිටි කාල සීමාව තුලදී දහස් ගනන් දේශීය ජනතාව ආක්‍රමනික හමුදා සේනාංක වෙත බලහත්කාරයෙන් බඳවා ගනු ලැබිනි. කෙසේවුවද බොහෝ අය ස්වෙච්ඡාවෙන් හමුදාවට බැඳීමට ඉදිරිපත් විය. යුක්රේනයේ හා සෝවියට් සංගමයේ අනෙකුත් ප්‍රදේශවල මෙන්ම බෝල්ටික් රාජ්‍යයන්වලදී ද මහජන සහයෝගයක් ගොනු කර ගැනීමට නාසීහු සමත්වීම ඊට පූර්වකාලයේ දී ස්ටැලින්වාදය විසින් කරන ලද පවාදීම්වලට ශාප ලත් චෝදනාවක් විය.

බර්ලිනයේ බිහිසුනු සටනින් පසු 1945 මැයි මාසයේ දී රතු හමුදාව නාසි ජර්මනියට එරෙහිව අවසාන ජයග්‍රහනය ලබාගත්තේ ය. එම වසරේ ජනවාරි මාසයේ වෝර්සෝව හා බෝල්ටික් රාජ්‍යයන් නිදහස් කර ගැනීම සමගින් ආරම්භ වී මාස 4ක් පුරා සෝවියට් හමුදාවලට බටහිර දිග සටන් කිරීමට සිදු වූ අතිවිශාල ප්‍රහාරයක අවසාන අදියර මෙය විය. ස්ටැලින්වාදී පාවාදීම්වල ඉතිහාසය මධ්‍යයේ වුව ද නාසි විරෝධී ප්‍රාදේශීය හමුදාවන්ගේ සහාය නිරන්තරව ලබා ගනිමින් ජනවාරි ප්‍රහාරය ආරම්භ වී දින ගනනක් ඇතුලත බෝල්ටික් කලාපය අල්ලා ගැනීමට රතු හමුදාවට හැකි විය.

බෝල්ටික් රාජ්‍යයන් විමුක්ත කර ගැනීමෙන් පසුව නාසි ආක්‍රමනය යටතේ සිදු කල අපරාධවල සමස්ත පරිමාව අනාවරනය කර ගනු ලැබී ය. අන්තර් යුද්ධ ස්වාධීනත්වයේ කාල පරිච්ඡේදය තුල දී ද අඩුවෙමින් තිබුනු ප්‍රාදේශීය යුදෙව් ජනගහන විශාල වසයෙන් විනාශ කොට තිබුනි. 1939 දී ලිතුවේනියානු ජන ගහනයෙන් ⅙ කට වැඩි ප්‍රමානයක් වූ ලක්ෂ ගනන් යුදෙව්වන් 1945 වන විට මුලිනුපුටා දමා තිබුනි.

## මතු සම්බන්ධයි

© www.wsws.org